පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක **492**

ධීවර අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා

සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ

නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டு தொடர் இல **492**

கடற்றொழில் அமைச்சு

நிலையான ஆணை எண். **119 (4)** இன் படி பொதுக் கணக்குகள் குழுவால் தாக்கல் செய்யப்பட்ட அறிக்கைகள் தொடர்பாக மாண்புமிகு

அமைச்சரின் கருத்துக்கள் மற்றும் அதற்காக எடுக்கப்பட்ட நடவடிக்கைகள் தொடர்பான தகவல்களை சமர்ப்பித்தல்

**Parliamentary Series Number 492**

**Ministry of Fisheries**

**Submission of observations of Hon.Minister and**

**steps taken with regard to the reports tabled by the Committee on Public**

**Accounts in terms of Standing Order No.119 (4)**

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492**

**ධීවර අමාත්‍යාංශය**

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492
ධීවර අමාත්‍යාංශය

| කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු<br>කොටස I – 86 සහ කොටස II - 76 | එම අඩුපාඩු /වත්මන් තත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | විගණන විමසුම් සඳහා හැකි සෑම අවස්ථාවකම මසක් තුල පිළිතුරු සපයා ඇත. ඉදිරියේදී සෑම විගණන විමසුමක් සඳහාම මසක් ඇතුළත පිළිතුරු ලබා දීමට උපදෙස් ලබා දී ඇත. |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | විගණන විමසුම් සඳහා හැකි සෑම අවස්ථාවකම මසක් තුල පිළිතුරු සපයා ඇත. ඉදිරියේදී සෑම විගණන විමසුමක් සඳහාම මසක් ඇතුළත පිළිතුරු ලබා දීමට උපදෙස් ලබා දී ඇත. |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා ,ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 මූල්‍ය වර්ෂයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌණතාවලට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යම් ප්‍රමාදයක් නිරීක්ෂණය වුවද ඉන් පසු වර්ෂයන්හිදී එවැනි ප්‍රමාදයන් ඇති නොවන පරිදි අදාළ නිර්දේශ ක්‍රියාත්මක කර ඇති බව කාරුණිකව වාර්තා කරමි. |
| සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | මේ වන විට සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත. |

| කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු<br>**කොටස I – 86 සහ කොටස II - 76** | **එම අඩුපාඩු /වත්මන් තත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග** |
|---|---|
| පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කරමින් පහත ශේෂ රජයේ ආදායමට බැර කර ඇත.<br><br>වර්ෂය — බැර කරන ලද මුදල රු.<br>2022 — 13,414,404.60<br>2023 — 6,700,486.80<br>2024 — 6,912,783.55<br>2025 — 770,336.50<br><br>විවිධ විශේෂ හේතූන් මත වර්ෂ 2 ඉක්ම වූ ඉතිරි ශේෂ රජයේ ආදායමට බැර කිරීමට අනුමත නොකළ අතර ඒවා ඉදිරියට රඳවාගෙන ඇත. |
| 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි. | පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය 2024 වර්ෂයේ සිට පිළියෙළ කර අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කර ඇත. |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | මේ වන විට 2024 හා 2025 වර්ෂයන්ට අදාළව මානව සම්පත් සැලැස්ම පිළියෙළ කර ඇත. 2026 වර්ෂයට සකස් කරමින් පවතී. |
| සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. | 2025 වර්ෂයේ සියලුම නිලධාරීන්ට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථා ලබා දී ඇත. |

| කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු<br>කොටස I – 86 සහ කොටස II - 76 | එම අඩුපාඩු /වත්මන් තත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|
| සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | 02/2018(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 03 ඡේදයෙන් කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවන බව දක්වා ඇත. |
| සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2025 වර්ෂයේ මානව සම්පත් සැලැස්මට අනුව පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ඉක්මවා ඇත. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ නොවන අතර 2023 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් ලබා දී ඇත. |

ආචාර්ය බී.කේ.කෝලිත කමල් ජිනදාස,
ලේකම්,
ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය.

ආචාර්ය බී.කේ. කෝලිත කමල් ජිනදාස
ලේකම්
ධීවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
02 වන මහල නව මහලේකම් කාර්යාලය
මාලිගාවත්ත, කොළඹ 10

රාමලිංගම් චන්ද්‍රසේකර්,
ගරු අමාත්‍ය,
ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය.

15/6/2026.

Ramalingam Chandrasekar (M.P.)
Minister of Fisheries, Aqautic and
Ocean Resources
New Secretariat Office, Maligawatta
Colombo 10.